8 වසර.

## 3.0 - සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ.

### 3.1 - සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ.

### පහතරට බෙරය.

පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි. යක්බෙරය, රුහුණු බෙරය, දෙවොල් බෙරය, දික් බෙරය, ඝෝෂා බෙරය යන විවිධ නම් වලින් ද හැඳින්වේ.

යක් තොවිල් වලට යොදාගන්නා බැවින් යක් බෙරය ලෙසත්, දෙවොල් මඩුවට යොදාගන්නා බැවින් දෙවොල් බෙරය ලෙසත්, රුහුණු ප්‍රදේශයේ භාවිත කරන බැවින් රුහුණු බෙරය ලෙසත්, මහා ඝෝෂාකාරී ශබ්දයක් ඇති බැවින් ඝෝෂා බෙරය ලෙසත්, දිගටි ස්වරූපයක් ගන්නා බැවින් දික් බෙරය ලෙසත් මෙය හඳුන්වනු ලැබේ.

පහතරට බෙරය සකස් කිරීම සඳහා යොදාගන්නේ අරටු සහිත ශක්තිමත් ගස්වල කඳන්ය. පොල්, කිතුල්, ඇහැළ, කොහොඹ හා කොස්, වැනි ශාක මේ සඳහා වඩාත් සුදුසුය. සම්ප්‍රදායික ක්‍රමය අනුව බෙර කඳෙහි දිග තුන් වියත් තුනඟුලකි. මින් අදහස් කරන්නේ වාදක ශිල්පියාගේ අතින් වියත් තුනකුත් ඇඟිලි තුනක ප්‍රමාණයයි. බෙර ~~මුහුණත~~ මුහුණතෙහි විෂ්කම්භය අඟල් 9 ක් හෝ 10 ක් හෝ පමණ වේ.

හැක්ම, වෙන්වර හා වරපටි සඳහා හරක් හම් යොදාගනී. වරපටි අඟල් 1/4 ක පමණ සිහින් විය යුතුය. බෙර ඇස සඳහා යොදාගන්නේ හරක් බොක්කේ සිවිය වේ.

පහතරට බෙරයේ දෙපසට යොදන බෙර සිවිවල සුළු වශයෙන් වෙනස්කම් ඇති අතර, තයි කට්ටුවට හරමක් සම්මක් සිවියක් යොදාගැනේ. එය බෙරයේ වම් පැත්ත ලෙසත්, දකුණු පැත්ත කුරල් කට්ටුව හෙවත් තෙරළුන පැත්ත ලෙස හැඳින්වේ. බීජාක්ෂර වැයීමේදී "තත්, තොං" යන අක්ෂර තයි කට්ටුවෙන් ද, "ජිත්, තං" යන අක්ෂර කුරල් කට්ටුවෙන් ද වාදනය කෙරේ.

පැවරුම.

* ඉහත සඳහන් කර ඇති සටහන නර්තන පොතෙහි සටහන් කරගන්න.
* පහතරට බෙරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
* යොදා ගන්නා අමු ද්‍රව්‍ය නම් කරන්න.
* බෙරයෙහි රූපසටහනක් ඇඳ, කොටස් නම් කරන්න.